සුභාවිත කලාවේ නිම වළලූ ප්‍රසාරණය කරනු වස් අතුල කල්දෙමුල්ලයන් විසින් කල මෙහෙය අමිලය. නමුත් සැම විටම නිහඬ තිරය පිටුපස චරිතයක් වූ අතුල පිළිබඳව ජනතාව අතරට ගිය තොරතුරු මදියැයි මට හැගේ. වසර ගණනාවක සිට සිඩ්නි හි වෙසෙන අතුලයන් තම දැනුම සහ කළා හැකියාවන් සිඩ්නි ජනතාව සමග බෙදා හදා ගන්නේ ඉතා නිහතමාණීවය. එසේ හෙයින් මේ සුන්දර කළා කරුවා පිළිබඳව කෙටි සටහනක් ගෙනන ඒමට මට සිත්විය. මන්ද පිදිය යුත්තන් පිදීම මංගල කරුණක් ම වන හෙයිනි .

ගීතය ,චිත්‍රය ,හා පත්‍ර කලාව තම ආත්ම ප්‍රකාශනය කරගත් අතුල මට මුල් වරට හමුවන්නේ 2012 වසර අග භාගයේදීය. එතැන් පටන් ඇරඹි අප මිතු දම ඔස්සේ මා ද කළාව පිළිබඳව බොහෝ දේ ඔහුගෙන් උගත්තෙමි. අතුල යනු සැබවින්ම

සහභාගී වුනා. තුසිත මලලසේකර හා දොස්තර නන්දදාස කෝදාගොඩයන් කළ ..විද්‍යා සංග්‍රහය, මර්වින් සෙනාරත්න හා ගුණරත්න අබේසේකරයන් ඉදිරිපත් කළ ..සරස්වතී මණ්ඩපය.. කණිටු සරසවිය ගුවන් විදුලියේ මා සම්බන්ධ වූ වැඩ සටහන්.

මට ඔය අතරම අවස්ථාවක් ලැබෙනවා රැකියාවට අමතරව සරසවිය කියන කලා පුවත් පත සමග එක්වීමට. ඇත්තටම මාගේ කාර්යය වුයේ සරසවිය නව මුහුණු වරකින් ජනතාව අතරට ගෙන යාම සහ එහි මුල් පිට හැඩ ගැන්වීමයි, මට මතක විදිහට මේ 1985 වගේ වකවානුවකයි. ඇත්තටම මේ කටයුතු නිසා මට නිතරම කලාවට සම්බන්ධ පුද්ගලයින් ඇසුරු කිරීමට අවස්ථාව ලැබෙනවා.

ඔය විදිහට තමය් මට ගුණදාස කපුගේ කියන කලාකරුවා මුණ ගැසෙන්නෙත්. කපුගේ තමයි මට මුල් වරට ආරාධනාවක් කරන්නේ ගීතයක් රචනා

# පන්හිඳක ගුණ සුවඳ

# අතුල

නිරහංකාර , පවතින ස්වභාවය ප්‍රත්‍යක්ෂ කළ, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කලාකරුවෙකි. අපි අතුලට සවන් දෙමු.

මොරටුව කියන ගම ප්‍රසිද්ධ ලීබඩු වලටම විතරක් නොවෙයි චානක .මොරටුව කියන්නේ ලංකා මාතාවට බොහෝ කළා කරුවන් පිරිසක් බිකල පුරවරයක්.ඉතින් කල්ලෙදෙමුල්ල කියන මොරටු ග්‍රාමයේ උපන් මට කලාව පිළිබඳව හැගීමක් කුඩා කල සිටම විය .එක හරියට ,සුළියකට හසුවූ ඔරුවක් කොහොමද ඈත දියබට ගසාගෙන යන්නේ ,අන්න ඒ වගේ තමයි මොරටුව කියන කළා පුරයේ හැදී වැඩුන මමත් කළා කරුවෙක් වෙන්නේ.මට මතකයි මගේ අයියා නිහාල් ,දැනට ජීවතුන් අතර නැතත් ,පුස්තකාලයක් තරමට වටිනා පොත් තිබුනා ,මම පොඩිකාලේ ඔහුගේ පොත් රාක්කයේ රැඳී පොත පත මට ඉඩ ලැබෙන හැම මොහොතක කියවනවා .ඒ වගේම මට පුරුද්දක් තිබුනා මේ පොත් කියවල අවසානේ , අන්තිම කොලයේ පොතේ එන කතාවට අනුකූලව චිත්‍රයක් අදින එක. ඉතින් සමහර වෙලාවට මම අය්යාගෙන් බැණුනුත් අහනවා ඔය වැඩේට. කෙසේ නමුත් මගේ කුඩා කාලය ඔන්න ඔයවගේ තමයි. උසස් පෙළට වාණිජ විෂය හැදෑරුවා මම වෙළඳ ප්‍රචාරක මාධ්‍ය කලාවට




සුමති ටෙලි උළෙලට උරදුන්නෝ..

යූ.ඩබ්ලිව්. සුමතිපාල අනුස්මරණ සම්මානය නිර්මාණය කළ

අතුල උපසිරි කල්දෙමුල්ල

වේදිකා පරිපාලනය කළ

සතිස්චන්ද්‍ර එදිරිසිංහ

වේදිකාව නිර්මාණය කළ

නර්තන අංශය භාරව සිටි

ආරියරත්න

යොමුවෙන්නේ ඇත්තටම, මමවත් නොසිතපු අවස්ථාවක නොපැතූ විදිහටය. මට මතකයි මම 1980 වසරේ සම්මුඛ පරීක්ෂණයකට පෙනිසිටිනවා Grant KENYON ආයතනයේ ..මට මේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින්නට අවස්ථාව සලසා දෙන්නේ එහි සේවය කළ පීටර් පිරිස්. මහින්ද ජීවානන්ද තමා කලා අදියුරු වෙන්නේ එවකට. මෙහිදී හරි පුදුම දෙයක් සිදුවෙනවා. එනම් සම්මුඛ පරීක්ෂණය අවසානයේ ඔවුන් මට රැකියාව එදින සිටම ඇරඹීමට අරාධනා කරනවා.

මගේ චිත්‍රයක් පළමු වරට පත්‍රයක පලවන්නේ 1980 මුල් බාගයේ ලංකාදීප පත්‍රයේ. මෙය නම් වන්නේ කුරුළු ආදරය යන මැයෙන්. නමුත් පසුව මගේ බොහෝ කටයුතු සිදුවෙන්නේ මිහිර පත්තරය සමගය. පසුව සිත්තර, සුහද, සිතුවම, වැනි චිත්‍ර කතා පත්තර වලටත් නිර්මාණ කළා. කාලයක් මම ගුවන් විදුලියේ පිටපත් කියවන්නෙක් හැටියටත්

කිරීමට අරාධනා ස්වර දැහැනට.

මගේ අතින් ලියවුන විල ලස්සනයි සුවදැති මල් පිපුනාම කියන ගීතය කපුගේ ගේ මදුර හඬින් ගැයෙන්නේ ඔන්න ඔය විදිහටයි. කපුගේ ඔහුගේ කම්පණ ප්‍රසංගයටත් මේ ගීතය කීපවරක්ම යොදාගත්තා. එසේම මේ ගීතය එක්තරා යුගයක ගුවන් විදුලියේ වාරණය වෙනවා. හේතුව මෙහි එක කොටසක කියවෙනවා ජීවත් වෙන්න නොමැරී මැරෙනා රටක ජීවත් වෙන මිනිසුන් සෙවුමයි කටුක කියල. ඉතින් එදා පැවිති රජයට මේක ටිකක් නුරුස්සා ගියා. හැබැයි කපුගේ මේ ගීතයට ලෙන්ගතු වෙන්න බලපෑවෙත් ඔය කතාවම තමයි. මොකද කපුගේ විශ්වාස කරපු දෙයක් තමයි කලාකරුව හැමදාමත් විපක්ෂයේ සිට වරද, වරද විදිහට දැකිය යුතුයි කියන ස්ථාවරය.

ආරාධනා ස්වර දැහනට ගීයක් කිරීමට ලැබීම ගීත රචකයෙක් විදිහට මා ලැබූ භාග්‍යයක් හැටියටයි අදටත් මම සලකන්නේ. ඒවගේම ඒවෙනකොට තිබුන ගීත රචනා බැංකුව කියල දෙයක් මේ අපේ ගුවන් විදුලියේ . ඉතින් චිත්‍රානන්ද අබේසේකරයන් තමයි මේ වැඩසටහන මෙහෙයවුයේ. එතුමා මගේ

# චානක ඉලංගගේ 365 දින මුහුණු

ගීත තුනකට අවස්ථාව ලබාදෙනවා මෙම වැඩසටහන තුළ. ඒ ගීත තුන තමයි , ඩබ් ඩී ආරියසිංහයන් මුලින්ම ගුවන් විදුලියට ගැයූ උස් කඳු මුදුණින් නැගෙනා බින්දු. එතනින් එහාට තිස්ස බණ්ඩාරයන් ගයන ලිපේ ගින්න අඩුවී යනවා වගේ ගීත. මිට අමතරව මට අවස්ථාවක් ලැබෙනවා ගව්වෙන් ගව්ව ටෙලි නාට්‍ය සදහා ගීතයක් කිරීමට. මේ ගීතය ගායනා කලේ විශාරද එඩ්වර්ඩ් ජයකොඩි කියන කලාකරුවයි . එසේම 1991 සාෆ් ක්‍රීඩා තරගය වෙනුවෙන් මා කල ගීතයට එම ගීත රචනා තරගයේදී දෙවන ස්ථානය හිමි වෙනවා .

මෙරටට ආව පසුව මුලින්ම මම පත්තරේකට ලියන්න පටන් ගන්නේ මෙල්බර්න්හි Serandib News කියන මාසික පුවත් පතට. විරෝෂ් පෙරේරා තමයි Serandib News වල කාර්ය භාරය පවරන්නේ. ඔහුට ස්තුති වන්ත විය යුතුයි. ඔය පුවත් පත හා බැදුණු නිර්මාණශීලි අපූර්ව පුද්ගලයෙක් මුණාගැහෙනවා 2000 වසරේදී. ඔහු තමයි ඒ යුගයේ සෙරෙන්ඩිබ් සිංහල පිටු බාරව හිටිය සහෘද ජගත් ජේ එදිරිසිංහයන්. මේ මගේ හිතවතාට මම ප්‍රවීණ ශිල්පියකු ලෙස ගෞරව කරනවා, ඔහු අතින් මෙරට කලාවට ඉටු කරන සේවාව ගැන. ඔහු පොත පත ලේඛන කලාවට කරන මෙහෙවර බොහොමයි. දක්ෂයකු කියන දේ පෙන්වල ඉවරයි. අපිට තින්නේ ඔහුගේ නිර්මාණ රසවිදින්නට පමණයි.

කලාව කියන මේ විෂය ඉතාම පුළුල් පරාසයක පැතිරී පවතින දෙයක්. මේ අතරිනුත් ගීතය තමයි මිනිසාට ඉතාම සමීපතම කළාව වන්නේ. මගේ ගීතය තුල බොහෝවිට අඩංගු වන්නේ මා දුටු සමාජ වටපිටාව සහ මාගේම ජිවිත අත්දැකීම්. නමුත් අද කලාවද වාණිජ කරණය වී හමාරයි. එවැනි තත්වයක් තුල මා එදා ලියු "ජීවත් වෙන්න නොමැරී මැරෙන රටක ජිවත් වෙන මිනිසුන් සෙවුමයි කටුක" කියන එක අදටත් වලංගුයි. අද පවතින කලාව පිලිබදව නොයෙක් විවේචන තිබුනත් මම නම් හිතන්නේ ඔය හැම දෙයම කාලයත් සමග සිදුවන වෙනස් කම් විදිහටයි. නැතිනම් හුදෙක් අත්හදා බැලීම්ම පමණි . අද බිහිවෙන සුපර්ස්ටාර්ස්ලා , මෙගා ස්ටාර්ස්ලා පිරිස බැලූවම අහසේ තියෙන තරු වලටත් වැඩි තරමයි . තරුණයන්ට දොසක් කියල වැඩක් නැහැ. මෙන්න මේ දේය කළ යුතු කියා හුරු කරන අයයි වග කියන්න ඕනා. මම දැක්ක ලිපියක සඳහන් වෙලා තිනවා. දැන් තරුණ පිරිස් ආදර අදෝනා ම තමා කියන්නේ කියල. ආදරය අවශ්‍යයි. හැබැයි සුන්දරව මටසිලිටු ගතියට ශ්‍රාවකයාගේ හදවත ස්පර්ශ කරන ආ කාරයෙන්. ඉතින් එවැනි වටපිටාවක් තුල මම ටිකක් නිෂ්ශබ්දයි .මොකද හැම නියගයකට පසුව අනෝරා වර්ෂාවක් වහිනවා. අනික මිනිසුන්ට හොඳ දේ වල වල අගය දැනෙන්නෙත් නරක දේවල් වැඩි උන තරමටයි. මම හැමවිටම මගේ පන්හිඳ සෙලවුයේ මගේ රසිකයින්ට රසවත් ,හරවත් යමක් දීමටයි. එය ඉදිරියටත් එසේමයි.

ඩිජිටල් චිත්‍රය සහ වෙළඳ ප්‍රචාරණය මගේ රැකියාවයි. සිරස ගුවන් විදුලියේ නිළ ලාංඡනය නිම වන්නේ මගේ පන්හිදෙන්, විදුල ළමා ගුවන් විදුලියේ ලාංඡනය නිමවන්නේ මගේ පන්හිදෙන් , එසේම නළුවෙකුට හෝ නිළියකට ජිවිතේ එක වරක් පමණක් හිමිවන සුමති ටෙලි සම්මානේ නිර්මාණය වන්නේ මගේ දැතින් . ඉතින් මේක මට හරි නිහතමානි ආඩම්බරයක්. කළා කරුවෙක් විදහට මා කවදාවත් එකම රාමුවකට කොටුවී වැඩ කලේ නෑ. ජනමාධ්‍යවේදියෙක් විදිහට සමාජයේ බොහෝ ඇසු පිරු තැන් ස්පර්ශ කිරීමේ අවස්ථා මට ලැබුණා. මම අදටත් සන්නස පත්තරය සමග මගේ ලේඛන කලාව ඉදිරියට කරගෙන යනවා . "සිද්ධි" කියන සාර සංග්‍රහය මා සන්නස පත්තරයට රචනා කරනුයේ මා ජිවිතයේ අත්දුටු සබෑම අත්දැකීම් අලලා යි.

40 පිටට

